# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2179/14 - 2020 ජුනි මස 10 වැනි බදාදා - 2020.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ල/ප්‍රාලේ/3/3/7/3.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/96/FR/153.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මෙහි මහජන කටයුත්තත් යනු නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා රජයට අත්පත් කරගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ඊ 386 ඇටන්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වල්පොලමුල්ල ගමේ පිහිටි කළුපහන වත්ත ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් 2019.09.10 දිනැතිව පිළියෙල කරන ලද හු. මු. පි. 21හි අතිරේක අංක 7, පත්‍ර අංකය 35හි කැබලි අංක 1492 හා 1493 හි මුළු වර්ගඵලය හෙක්ටයාර් 20.2343 වේ.

1. **කැබලි අංකය: 1492**
ඉඩමේ නම: වල්පොලමුල්ල; ඉඩම් පරිහරණය: කුඹුර (පාළු); හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: අංක 10, සාප්පු වත්ත, පලාපත්වල, මාතලේ පදිංචිව මියගිය කේ. ඒ. ඇල්ලේපොල: ඉඩම් ප්‍රමාණය : හෙක්. 1.8970.

2. **කැබලි අංකය: 1493**
ඉඩමේ නම: වල්පොලමුල්ල; ඉඩම් පරිහරණය: කැළෑව; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: අංක 10, සාප්පු වත්ත, පලාපත්වල, මාතලේ පදිංචිව මියගිය කේ. ඒ. ඇල්ලේපොල; ඉඩම් ප්‍රමාණය: හෙක්. 18.3373.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ජූලි මස 08 වැනි දින පෙ. ව. 10.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ජුනි මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2020 මැයි මස 11 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-188

1A - G 32311 – 17 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*